# මාක්ස්වාදී ආර්ථික චින්තනය පිළිබඳ විමසුම

බී.එල්.එම්.ඩී. බුත්පිටිය, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා පළමු වසර
madhavidanushika12@gmail.com

එච්.පී.ඩී.ඩී. ආරියසිංහ, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා පළමු වසර
duleenadilhani92@gmail.com

ඒ.පී.ටී.එස්. ගුණරත්න, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා පළමු වසර
thushanigunarathne@gmail.com

**සංක්ෂේපය**

මාක්ස්වාදී ආර්ථික චින්තනය පිළිබඳ විමසුම යන මාතෘකාව යටතේ මාක්ස්වාදී ආර්ථික චින්තනය කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙහි මූලික අරමුණ වන්නේ මාක්ස්වාදී චින්තනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කිරීම හා එය  වර්තමානය තුළ කොතරම් දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම යි. මාක්ස්වාදී චින්තනය තුළින් සැබවින් ම ධනපතියන් විසින් නිර්ධන පංතිය සූරා කන්නේ ද යන්න පිළිබඳව ද අවධානය යොමු කර ඇත. ද්විතියික දත්ත උපයෝගී කරගනිමින් මෙම මාතෘකාව සඳහා දත්ත ඒකරාශී කොට ගෙන ඇත. එනම් පොත්පත්, අන්තර්ජාලය, පුවත්පත්, සඟරා හරහා තොරතුරු ලබාගෙන ඇත. ඒ අනුව මාක්ස්වාදී ආර්ථික චින්තනය පිළිබඳවත් එය වර්තමානයේ කොතරම් දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳවත් ඉදිරිපත් කර ඇත. මාක්ස්වාදී ආර්ථික චින්තනය දෙස අවධානය යොමු කරන කල දක්නට ලැබෙන්නේ වර්තමානයේ ද එය වෙනස් අන්දමකින් ක්‍රියාත්මක වන බව යි. සමස්තයක් ලෙස බලන කල පෙර මෙන් ම අද වන විටත් බොහෝ රටවල නිර්ධන පංතිය සූරාකෑම දක්නට ලැබේ.

**මුඛ්‍ය පදඃ** මාර්ක්ස්වාදය, ආර්ථික චින්තනය

## හැඳින්වීම

මාක්ස්වාදී ආර්ථික චින්තනය යන මාතෘකාව තුළින් මාක්ස්වාදී චින්තනය හා මාක්ස්වාදී ආර්ථික චින්තනය පිළිබඳ දක්වා ඇත. මෙහි දී ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී විවරණය, අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යාය, පන්ති සටන/අරගලය පිළිබඳ න්‍යාය සහ ප්‍රාග්ධන රාශීකරණය ඔස්සේ ගලා යන මාක්ස්වාදී ආර්ථික  චින්තනය විග්‍රහ කර ඇත.

මාක්ස්වාදය යනු හුදෙක් ම ධනවාදය විවේචනය කිරීම සඳහා ඉදිරිපත් වූ දර්ශනයක් වේ. මෙහි දී මාක්ස්වාදී ආර්ථික  චින්තනය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවේචන පිළිබඳ අවධානය යොමු කර ඇත. මේ ආකාරයට කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් එක් ව ඉදිරිපත් කරන ලද සුවිශේෂී න්‍යායේ එක් පැතිකඩක් පිළිබඳ මෙම ලිපිය මඟින් අවධානය යොමු කර ඇත.

## මාක්ස්වාදී චින්තනය

මාක්ස්වාදය යන වචනය ඉංග්‍රීසින් විසින් භාවිතා කර ඇත්තේ ධනවාදයට, පුද්ගලවාදයට සහ පෞද්ගලික දේපල ක්‍රමයට පටහැනි සංකල්පයක් ලෙස ය. සමහර විචාරකයින් එය ධනවාදී ක්‍රමයට එරෙහිව 18 වන සියවසේ යුරෝපයේ ඇති වූ නිර්ධන පංතියේ දේශපාලන දර්ශනයන් ලෙස හඳුන්වා ඇත. එනම් යුරෝපයේ කාර්මික විප්ලවයෙන් පසු සිදු වූ පරිවර්තනය තුළින් ඇති ප්‍රතිඵල ආර්ථිකයේ සියලු අංශවලට සමානව බෙදුණේ නැත. එකල සමාජයේ සිටි ධනපතියන් නිර්ධනයන් හෙවත් කම්කරුවන්ගේ ශ්‍රමය සූරාකමින් අතිප්‍රමාණ ලාභ ගැනීම සිදු වීමත් නිසා නිර්ධන පන්තිය දැඩි ලෙස පීඩාවට පත්වීම සිදුවිය. මෙලෙස පිඩාවට පත් නිර්ධන පන්තියේ වරප්‍රසාද ආරක්ෂා කර යහපත් ජීවන මට්ටමක් හිමිකර දීම පිළිබඳ අදහස් දැක්වෙන ධනවාදී ක්‍රමයට එරෙහිව මතවාදයක් ඉදිරිපත් වූ මතවාදයක් ලෙස සමාජවාදී මතවාදය හැඳින්විය හැකි ය. ඒ අනුව මාර්ක්ස්වාදය වූ කලී ධනවාදය විවේචනය සඳහා ඉදිරිපත් වූ දර්ශනයෙහි මේ පිළිබඳ ඇත්තේ ඉදිරිපත් කළ චින්තකයන් ලෙස කාල් මාක්ස් සහ ෆෙඩ්රික් ඒංගල්ස් ප්‍රධාන වේ. මෙම දර්ශනය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූයේ රුසියාවේ වී.අයි. ලෙනින් විසිනි.

මාක්ස්වාදය පරිපූර්ණ දර්ශනයක් ලෙස ලෝකය වෙනස් කරන විප්ලව දර්ශනයන්හි මාක්ස්වාදී අදහස් ඉදිරිපත් කර ඇත්තේ 1847 දී ඉදිරිපත් කරන ලද 'කොමියුනිස්ට් ප්‍රකාශනය' යන ග්‍රන්ථයෙන් සහ 1867 දී මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද 'දාස් කැපිටාල්' (Das capital) නැමති ග්‍රන්ථයෙනි. මාක්ස්වාදය ගොඩ නැගීමට මූලාශ්‍ර වී ඇත්තේ ජර්මානු දර්ශනවාදය ඉංග්‍රීසි ආර්ථිකවිද්‍යාව හා ප්‍රංශ දේශපාලනය යි. ආර්ථික සාධනය මුල් කර ගෙන ඉතිහාසය හා ප්‍රමාණය පිළිබඳ පුළුල් දර්ශනයක් මෙමඟින් ඉදිරිපත් කර ඇත. මාක්ස්වාදය ගොඩනැගී ඇත්තේ ද්විසටනාත්මක භෞතිකවාදය පදනම් කරගෙන ය. මාක්ස් සහ ඒංගල්ස් සමාජය දෙස බැලූ ආකාරය අපෝහක භෞතිකවාදය වේ. එනම් පුද්ගලයන් හා සිය සමාජීය වර්ධනය ලෙස බැලූ තාර්කික ක්‍රමය යි. ධනවාදී ආර්ථික චින්තකයින් විසින් මාක්ස්වාදය ප්‍රායෝගික තත්ත්වයට පත් නොවන බව ප්‍රකාශ කළ ද දෙවන ලෝක යුද්ධයෙන් පසු චීනය වැනි රටවල් සමාජවාදී රටවල් බවට පත් වී ඇත (මන්ඩෙල්, 1980).

## මාක්ස්වාදී ආර්ථික චින්තනය

කාල් මාක්ස් විසින් ආර්ථික චින්තනය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් ඔහු විසින් 1867 දී ප්‍රකාශයට පත් කරන ලද Das Capital නමැති ග්‍රන්ථයේ ඇතුළත් වේ. මාක්ස්වාදී ආර්ථික චින්තනය ප්‍රධාන අංග කිහිපයක් යටතේ අවධානයට යොමු කළ හැකි ය.

- ද්විසටනාත්මක භෞතිකවාදය
- ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යාත්මක විග්‍රහය
- අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යාය
- පන්ති අරගලය පිළිබඳ න්‍යාය
- සංචිත ශ්‍රම හමුදාව පිළිබඳ සංකල්පය

කාල් මාක්ස්ගේ ආර්ථික චින්තනය තේරුම් ගැනීම සඳහා ඔහු විසින් ඉදිරිපත් කරන ලද න්‍යායාත්මක සංකල්පය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

මාක්ස්වාදය පදනම් වී ඇත්තේ ද්විසටනාත්මක චින්තන ක්‍රමය මත ය. ද්විසටනාත්මක භෞතිකවාදය යනු විඥානවාදී දාර්ශනික සංකල්පයකි. මෙම සංකල්පය මඟින් කිසියම් දෙයක් වටහා ගැනිමේ දී ඒ තුළ පවත්නා අනේක විධ ප්‍රතිවිරෝධතා හා ඒවායේ ගැටුම් සැළකිල්ලට ගනු ලබ යි. එය කිසියම් දෙයක් නිත්‍ය හෝ වෙනස් නොවන බව හෝ නොපිළිගනි. සියලු දෙයක් ම වෙනස් වෙමින් සංවර්ධනය වන බව ප්‍රතිවිරුද්ධ බලවේග ගැටුම් තුළින් ජනිත වන බව පිළිගනී. මේ අනුව ද්විසටනාත්මක ක්‍රියාවලිය අනුව විශ්ව මනස හෙවත් සමස්ත ලෝකය ක්‍රමානුකූලව වෙනස් වී අවසානයේ ස්වයං අවබෝධ තත්ත්වයට පත් වේ. මෙම ක්‍රියාවලිය ප්‍රතිවාදය සහ සහවාදය ලෙස ඒංගල්ස් විසින් හඳුන්වා දී ඇත. මාර්ක්ස් විසින් ද්විසටනාත්මකවාදය ද්විත්ව ස්වරූපයකින් ක්‍රියාත්මක වන බව පිළිගන්නේ නැත. ද්විසටනාත්මක වාදය ද්විත්ව ස්වරූපයකින් සියලු කරුණු සිදුවන බව හෝ පරිණාමය වන බව පිළිගත් නමුදු එය සිදුවන්නේ භෞතිකවාදී ක්‍රමයට බව මාක්ස්ගේ අදහස විය. ඒ අනුව භෞතිකයේ පරිණාමය හේතු කොටගෙන සිදුවන සමාජයේ පරිණාමය බව මාක්ස් ප්‍රකාශ කර ඇත. මේ හේතුවෙන් ධනවාදී ආර්ථික ක්‍රමය බිඳ වැටීම සිදු වේ.

ඉතිහාසය පිළිබඳ මාක්ස්ගේ අර්ථකථන මාක්ස් විසින් රචනාකරන ලද 'දේශපාලන ආර්ථිකයේ විවේචනය' නැමති ග්‍රන්ථයෙන් පැහැදිලි වේ. කාල් මාක්ස් දක්වන ආකරයට සියලු ම ඓතිහාසික සිද්ධීන් ආර්ථික කොන්දේසින් මඟින් බලපෑම් ලැබූ ඒවා වේ. ආර්ථික බලවේග මඟින් සමාජ, සංස්කෘතික, නෛතික සහ ව්‍යූහාත්මක සංයුතිය තීරණය වන බව මාක්ස් විශ්වාස කළේ ය. ඒ අනුව සමාජ ව්‍යූහය සකස් කිරීමේ දී ආර්ථික බලවේගවල වැදගත්කම ඔහු විසින් අවධාරණය කර තිබේ. ධනවාදී ආර්ථික ක්‍රමයේ ස්වරූපය පිළිබඳ කරුණු දැක් වූ ඔහු ධනවාදි යන්ත්‍ර ප්‍රාථමික සමාජවල සිට කොමියුනිස්ට් සමාජය කරා යාමේ දී හමුවන එක්තරා සන්ධිස්ථානයක් ලෙස අර්ථ දැක්වීය. ආර්ථික ක්‍රියාවලියේ හැසිරීම සම්බන්ධයෙන් දේශපාලනික, සමාජීය මෙන් ම සංස්කෘතික ලක්ෂණවල බලපෑම අඩු වැඩි වශයෙන් දක්නට ඇති බව මාක්ස් ප්‍රකාශ කර ඇත.

මාක්ස් ප්‍රකාශ කරන අන්දමට ආර්ථිකය ඉදිරියට තල්ලු වූයේ පංති අරගල මාලාවක ප්‍රතිඵලයක් ලෙස ය. සමාජයක පංති අරගලය සිදු වන්නේ දේපළ හිමි පංතිය සහ දේපළ අහිමි පංතිය අතර ය. ඒ අනුව ඉතිහාසය තුළ වහල් යුගය, වැඩවසම් යුගය, වෙළෙඳ යුගය, ධනවාදි යුගය ලෙස බෙදා දක්වන ලදී. මේ තුළ ධනවත් පංතිය සහ නිර්ධන පංතිය දැකිය හැකි ය. ඒ අනුව ස්වකීය විමුක්තිය පදනම් කර ගෙන පංති ගැටුමක් දැකිය හැකි ය. එනම් වැඩවසම් සමාජය විනාශ වූයේ ඒ තුළින් මධ්‍යම පංතියක් බිහි වීම නිසා ය. නිෂ්පාදනය හා වෙළෙඳාම දියුණු වීමෙන් බිහි වූ මධ්‍යම පංතියත් සමඟ ධනවාදී කාර්මික සමාජය බිහි විය. එම ධනවාදී ආර්ථිකයේ හටගන්නා අර්බුදකාරී ස්වාභාවය හේතු කොට ගෙන කර්මාන්තශාලාවල වැඩ කරන ශ්‍රමික බලවේග දියුණු වී පවතින ධනවාදී රාමුව විනාශ වන බව කාල් මාක්ස් පෙන්වා දුන්නේ ය. ශ්‍රමිකයන්ට ඉතා අඩු වැටුපකට සේවය කිරීමට සිදු වීම හා ධනවාදීන් උපයන ලාභවලින් විශාල කොටසක් කර්මාන්තශාලා පුළුල් කිරීමට හා වෙළෙඳපොළ අල්ලා ගැනීම සඳහා යොදවා ගැනීමට හැකි විය. ධනවාදීන් කම්කරුවන්ට ගෙවන අඩු වැටුප් නිසා කම්කරුවන්ගේ

ක්‍රය ශක්තිය හීන වී ගොස් ධනවාදීන් කෙරෙහි විරෝධතා හට ගන්නා බව මාක්ස් විසින් පෙන්වා දුන්නේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස ධනවාදීන්ට එරෙහිව කම්කරුවන් නැගී සිටිමින් කාර්මික නිෂ්පාදනය හා ශ්‍රමිකයන්ගෙ මූර්ත ආදායම්වල වර්ධනයක් සිදුවන බව මාක්ස් ප්‍රකාශ කළේ ය.

සම්භාව්‍යවාදීන් ඉදිරිපත් කරන්නට යෙදුණු නිෂ්පාදන ශ්‍රිතය මාක්ස් විසින් පිළිගත් අතර, මුළු නිමවුම තීරණය වන්නේ භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ශිල්පීය ප්‍රගතිය යන සාධක මත බව පෙන්වා දක්වා ඇත. මාක්ස් විසින් මුළු නිමවුම තීරණය වීමේ දී ශිල්පීය ප්‍රගතිය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. ආයෝජනය හා ශිල්පීය ප්‍රගතිය අතර දෙයාකාර සම්බන්ධයක් ඇති බව පෙන්වා දුන් අතර, මාක්ස් පෙන්නුම් කළේ ශිල්පීය දියුණුව සඳහා ආයෝජන පුළුල් කළ යුතු බවත්, ශිල්පීය ප්‍රගතිය නිසා ආයොජන පුළුල් කිරීමේ අවශ්‍යතාව පැන නගින බව මාක්ස් පෙන්වා දුන්නේ ය. මාක්ස්ගේ අදහස් සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින් ඉදිරිපත් කරන අදහස්වලින් වෙනස් වේ. සම්භාව්‍යය ආර්ථික විද්‍යාඥයින්ට අනුව ආයෝජනය ලාභයේ ශ්‍රිතයකි. නමුත් මාක්ස් දක්වන ආකාරයට ලබා ගත හැකි ඵලදා අනුපාතිකය ආයෝජනය කෙරෙහි බලපායි.

ලාභ වශයෙන් එකතු වන අතිරික්ත වටිනාකම වැඩි කරගැනීම කාල් මාක්ස්ට අනුව ධනවාදීන්ගේ මූලික අරමුණ ය. අතිරික්ත ශ්‍රම කාලය තුළ දී වැටුප් කම්කරුවන්ගේ ශ්‍රමය විසින් බිහිකරනු ලබන සහ ධනපතියා විසින් අත්පත් කරගනු ලබන වටිනාකම මාක්ස්වාදයට අනුව අතිරික්ත වටිනාකම යි. ලාභ උපරිම කරගැනීම සඳහා ධනපතීන් ප්‍රධාන වශයෙන් ක්‍රියාමාර්ග තුනක් අනුගමනය කරයි.

- ශ්‍රමිකයන්ගේ වැඩ කරන පැය ගණන වැඩි කිරීම
- යැපුම් මට්ටමේ වැටුප් අනුපාතයන්ට වඩා අඩු වැටුප් නියම කිරීම
- ශ්‍රමිකයන්ගේ ශ්‍රම ඵලදායිතාව සහ ශ්‍රමික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

කාල් මාක්ස් විසින් නිමවුමේ වටිනාකම ප්‍රධාන කොටස් 03 කට බෙදා දක්වා ඇත. එනම්,

- ස්ථාවර ප්‍රාග්ධනය = C
- විචල්‍ය ප්‍රාග්ධනය = V
- අතිරික්ත වටිනාකමයි = S

නිෂ්පාදනයේ දී යොදාගනු ලබන භූමිය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ වැනි දෑ ස්ථාවර ප්‍රාග්ධනය වේ. ශ්‍රමය මිල දී ගැනීම සඳහා යොදාගනු ලබන අරමුදල් ප්‍රමාණය මෙහි දී විචල්‍ය ප්‍රාග්ධනය ලෙස සලකයි. අතිරික්ත වටිනාකම ලෙස සලකනු ලබන්නේ ධනපතීන් උපයන ලාභ අතිරික්තය යි.

ධනපතියන් විසින් නිෂ්පාදන ක්‍රමයේ මිල නියම කිරීමේ දී ස්ථාවර ප්‍රාග්ධනයේ සහ විචල්‍ය ප්‍රාග්ධනයේ එකතුවට ලාභය එකතු කිරීමෙන් ප්‍රාග්ධනය ගණනය කරනු ලබයි. මාක්ස් ප්‍රාග්ධනය ගණනයට එකතු කරන ලද වෙනස වූයේ අතිරික්ත වටිනාකම යි. භාණ්ඩයේ මිල ස්ථාවර ප්‍රාග්ධනය හා විචල්‍ය ප්‍රාග්ධනයට අමතරව ශ්‍රම අතිරික්ත වටිනාකම එකතු වන බව මාක්ස් පෙන්වා දෙයි. භාණ්ඩ නිෂ්පාදනයේ දී අතිරික්ත වටිනාකමක් ඇති කර ගැනීම තුළින් ධනවාදී ආර්ථිකය ක්‍රමය තුළ ධනවාදීන් ලාභ ලබයි.

ලාභය යනු කම්කරුවන්ට වැටුප් නොගෙවන ලද භාණ්ඩයෙහි ඇති ශ්‍රම වටිනාකම යි. මේ අනුව මාක්ස් පෙන්නුම් කළේ ධනවාදී ආර්ථික ක්‍රමයක ලාභය යනු ශ්‍රමය සූරා කෑමක් බව ය.

මාක්ස් දක්වන ආකාරයට ධනවාදී ආර්ථික ක්‍රමයක ප්‍රධාන පංති දෙකක් දැකිය හැකි ය.

- ශ්‍රමය විකුණන කම්කරු පංතිය
- නිෂ්පාදන බලය හිමි කරගෙන සිටින ධනපති පංතිය

සමාජය තුළ සියලු ම නිෂ්පාදන මාර්ග ධනවාදීන් ලෙස හඳුන්වනු ලබන කුඩා කණ්ඩායමක් විසින් හිමි කර ගෙන සිටී. ඔවුන් තමන් සතු නිෂ්පාදන වෙනත් කෙනකුට අයිතිවීමට අකමැත්තක් දක්වා ඇත. ධනවාදීන්ට ශ්‍රමය විකුණන අනෙක් පංතිය කම්කරුවන් ය. අනෙකුත් භාණ්ඩමෙන් ශ්‍රමිකයා තම ශ්‍රමය වෙළෙඳපොළේ විකුණයි. එම ශ්‍රමය අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර සමඟ සම්බන්ධ කරගෙන ධනවාදීහු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරති. මෙකී නිෂ්පාදන භාණ්ඩ හා සේවා සඳහා  වෙළෙඳපොළේ මිලක් තීරණය වේ. එහෙත් කම්කරුවන්ට ගෙවන වැටුප් එම භාණ්ඩවල වෙළෙඳපොළ වටිනාකමට අඩු වේ. භාණ්ඩවල වෙළෙඳපොළ වටිනාකම හා ශ්‍රමිකයන්ට ගෙවන වැටුප් අතර වෙනස ලාභය නැතහොත් අතිරික්ත වටිනාකම වේ.

ධනවාදින් කිහිපදෙනකු අතර ඒකරාශී වන මෙම අතිරික්ත වටිනාකම ධනවාදී ආර්ථික ක්‍රමය යටතේ ඉවත් කළ හැක්කේ කම්කරු පංතියට නිෂ්පාදන හැකියාවන් හිමිවන ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කිරීමෙන් බව කාල්මාක්ස් විසින් ප්‍රකාශ කර ඇත. මේ නිසා ධනවාදී ආර්ථිකය තුළ පංති අරගලයක් බිහි වේ. නිර්ධන පංතිය ධනපති පංති සමඟ සටන් කර ධනවාදී සමාජ ක්‍රමය විනාශ වී සමාජවාදී ආර්ථික ක්‍රමයක් බිහිකර ගැනීමට හැකි වේ. මේ තුළ නිර්ධන පංතිය යටතේ රජයන් බිහි වීම සහ සියලු නිෂ්පාදන සාධක රජයට අයත් වේ. මාක්ස්ගේ මෙම න්‍යාය මුල් කාලයේ දී ප්‍රායෝගික දර්ශනයක් නො වුව ද පසුකාලීනව ක්‍රියාත්මක වන ආර්ථික න්‍යායන් පමණක් නොව, දේශපාලන දර්නයක්  ලෙස ද මාක්ස්වාදය තුළ ඇතුළත් වී ඇති බව පැහැදිලි වේ.

ධනවාදීන්ගේ මූලික අරමුණ වන්නේ ලාභ උපරිම කිරීම යි. ලාභ උපරිම කිරීම රඳා පවතින්නේ අතිරික්ත වටිනාකම උපරිම කිරීම මත ය. තාක්ෂණික දියුණුව මඟින් ශ්‍රමය ඉතිරි කරන ප්‍රාග්ධන සූක්ෂම ශිල්පීය ක්‍රම එනම්, යන්ත්‍ර සූත්‍ර භාවිතය කෙරෙහි ධනවාදීන් යොමු කරනු ලැබේ. ශ්‍රමය ඉතිරි කරන නිෂ්පාදන ශිල්පීය ක්‍රම භාවිතය හේතු කොටගෙන ශ්‍රම අතිරික්තයක් බිහි වේ. කාල් මාක්ස් ප්‍රකාශ කරන්නේ ප්‍රාග්ධන රාශිකරණය තුළින් නිෂ්පාදන කටයුතු සඳහා  ස්ථාවර ප්‍රාග්ධනය වැඩි වශයෙන් යොදාගන්නා අතර විචල්‍ය ප්‍රාග්ධනය හීන වන බවය. විචල්‍ය ප්‍රාග්ධනයට සාපේක්ෂව ස්ථාවර ප්‍රාග්ධනයේ වේගවත් වර්ධනය මඟින් සිදුවන්නේ ශ්‍රමයට ඇති ඉල්ලුම අඩු වීම යි. ඒ තුළින් බිහිවන ශ්‍රම අතිරික්තය කාර්මික සංචිත හමුදාව එනම්, සාපේක්ෂ අතිරික්ත ජනගහනය යනුවෙන් කාල් මාක්ස් හඳුන්වා ඇත. තාක්ෂණ වර්ධනය සමඟ ශ්‍රම අතිරික්තය ඉහළ යන අතර, ශ්‍රමිකයන්ගේ වැටුප් අනුපාතය යැපුම් මට්ටම දක්වා පහළ බසී. ඒ අනුව කම්කරුවන්ගේ ජීවන මට්ටම පහළ වැටී කම්කරුවන් යම් විරෝධතා අනුගමනය කරයි. ධනවාදීන් කම්කරුවන්ගේ වැටුප් කපා හරිමින් අතිරික්ත වටිනාකම වැඩි කර ගත් බව කාල් මාක්ස් පෙන්වා දෙයි.

**මාක්ස්වාදී ආර්ථික චින්තනය පිළිබඳ විවේචන**

කාල් මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද ආර්ථික චින්තනය සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් වී ඇත. ධනවාදී ආර්ථික ක්‍රමය තුළ මිනිස් ස්වාභාවය පිළිබඳ ඉදිරිපත් වී ඇති අදහස් අනුව මිනිසා සම්පත් හිමිකර ගැනීම සඳහා අසීමිත ආශාවක් දක්වයි. මේ නිසා මිනිසාගේ අසීමිත ආශාවන් තෘප්තිමත් කර ගැනීම දැකිය නොහැක. මේ නිසා දිගින් දිගටම නිෂ්පාදන කටයුතු සිදු කරයි. සමාජවාදී ආර්ථිකය තුළ මිනිසා මීට වඩා වෙනස් ස්වරූපයෙක් ගන්නා අතර සම්පත්වල හිමිකමට පොදු අයිතියක් පිළිබඳ අවධාරණය කර ඇත. පොදු අරමුණක් ඉටු කර ගැනීම සමාජවාදී ආර්ථිකය මඟින් සිදු වේ. මාක්ස්වාදය තුළ සාමූහිකත්වය පිළිබඳ අවධාරණය කළ ද පුද්ගල ස්වාභාවයට එරෙහිව යමින් දියුණුවක් ලබා ගත හැකියි යන අදහස ප්‍රතික්ෂේප කිරීම සඳහා කරුණු ඉදිරිපත් කර නැත.

ඊට අමතරව මාක්ස් විසින් ඉදිරිපත් කර ඇති අතිරික්ත වටිනාකම අතාත්වික සංකල්පයක් බවත්, ප්‍රායෝගිකව එය ධනවාදය තේරුම් ගැනීමට නොහැකි බවත් විචාරකයෝ ප්‍රකාශ කරති. අතිරික්ත වටිනාකම තීරණය වීම සඳහා ශ්‍රමය පමණක් පදනම් නොවන බවත්, ඊට අමතරව භූමිය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යන කරුණු පදනම් වේ. ඒ අනුව භාණ්ඩය සමානව ශ්‍රමිකයන්ට වැටුප් නොගෙවීම ශ්‍රමය සූරාකෑමක් ලෙස හැඳින්විය නොහැක. ධනවාදී ආර්ථිකයක් තුළ ව්‍යවසායන් ආරම්භ කිරීමට දායක වන්නේ ධනපතීන් ය. කම්කරුවන්ට අඩු වැටුප් ගෙවා ධනපතියෝ ලාභ ලබති. ඔවුන් ලබන ලාභය නැවත ආයෝජනය කර නිෂ්පාදන කටයුතු වේගවත් කරයි. මේ අනුව ආර්ථික සංවර්ධනයේ දී ධනවාදීන් මහත් මෙහෙවරක් සිදු කරයි. නූතන ධනවාදය ක්‍රියාත්මක වන රටවල කම්කරුවන් ඉහළ වැටුප් ගනී. උදාහරණ ලෙස ඇමරිකාව, බ්‍රිතාන්‍ය සහ ඕස්ට්‍රේලියාව හැඳින්විය හැකි ය. මේ අනුව අතිරික්ත වටිනාකම නූතන ධනවාදී ආර්ථිකය තුළ ක්‍රියාත්මක නොවන බව පැහැදිලි වේ.

මාක්ස්වාදයට එරෙහිව ඇති වූ විවේචනයක් වූයේ භෞතිකවාදය වාදය ඔස්සේ පැහැදිලි කරන ලද සමාජ විකාශනය වන බව අදහස ප්‍රවාදය සහ ප්‍රතිවාදය ලෙස සමාජය තුළ පවතින ද යන්න යි. මාක්ස්වාදීන් ප්‍රකාශ කළේ සමාජවාදය බිහිවීම තුළින් සියලු ප්‍රතිවිරෝධතා නැති වී සමානාත්මතාව හිමි වීම නිසා ශ්‍රමය සූරාකෑමක් දැකිය නොහැකි බව යි.

ධනවාදය විවේචනය කිරීම සඳහා ඉදිරිපත් වූ දර්ශනයක් ලෙස මාක්ස්වාදය දැක්විය හැකි ය. මේ පිළිබඳ අදහස් ඉදිරිපත් කළ චින්තකයන් ලෙස කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් ඒංගල්ස් ප්‍රධාන වේ (පතිරගේ, 2011).

**සමාලෝචනය**

මාක්ස්වාදීන් විසින් ඉදිරිපත් කරන ලද ආර්ථික චින්තනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පෙර මෙන් ම අද වන විටත් බොහෝ රටවල් තුළත් දක්නට ලැබෙන කරුණකි. මාක්ස්වාදීන්ගේ අදහසට අනුව නිර්ධනයන්ගේ ශ්‍රමය සූරා කෑමට ධනපතියෝ ක්‍රියා කරති. මේ අනුව ආර්ථික චින්තනය පිළිබඳ ඉදිරිපත් කිරීමේ දී ඔවුන් මූලික අවධානය යොමු කරන ප්‍රධාන අංග කිහිපයකි. ද්විසටනාත්මක භෞතිකවාදය, ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යාත්මක විග්‍රහය, අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යාය, පන්ති අරගලය පිළිබඳ න්‍යාය,

ප්‍රාග්ධන රාශිකරණය, ධනවාදය යටතේ ආර්ථික සංවර්ධනය ආදී අංග කෙරෙහි අවධානය යොමු කරමින් නිර්ධන පංතිය සූරාකන අයුරු විග්‍රහ කර ඇත.

මාක්ස්වාදීන් පවසන අන්දමට සැබැවින් ම කම්කරුවාගේ ශ්‍රමය සූරාකෑමට ලක් කර ඇත. මෙහි දී කම්කරුවන්ගේ ශ්‍රමය සූරා කමින් වැඩි ලාභයක් ලබා ගැනීමට ධනපතියෝ ක්‍රියා කරති. එසේ ම ධනවාදීන් කිහිපදෙනෙකු අතර පමණක් අතිරික්ත වටිනාකම එකතු වීම සිදුවිය. එතුළින් නිර්ධන පංතීන් අතර තවදුරටත් දරිද්‍රතාව වර්ධනය වීම සිදු විය. කෙසේ නමුත් අද වන විට එකල පැවති ශ්‍රම සූරාකෑමේ ක්‍රියා පටිපාටිය ඒ අයුරින් ම දක්නට නොලැබුණත් වෙනස් ආකාරයකින් ක්‍රියාත්මක වන බව දක්නට ලැබේ. දියුණු වන සමාජ ක්‍රමය තුළ නිර්ධන සමාජ පංතිය වර්ධනය කරන්නෝ ද දක්නට ලැබෙයි. අද වන විට පෙර පැවති ශ්‍රම සූරාකෑම දරුණු තත්වයකට පත්ව ඇත්තේ සැවොම පුදුම සහගත කරවමිනි. එනම්, ශ්‍රම සූරාකෑමට අමතරව ශරීර අවයව පවා මුදලට විකිණෙන සමාජ පංතියක් අද වන විට දක්නට ලැබේ. පොලී මෙන් ම බහු ජාතික සමාගම් තුළින් තවදුරටත් නිර්ධන පංතියට දරිද්‍රතාවට පත් කරන අයුරු දක්නට ලැබෙයි. සමස්තයක් ලෙස දකින කල අද වන විටත් සමානාත්මතාව හීනවන ශ්‍රමය සූරාකන සමාජයක් වෙනස් ආකාරයකින් ක්‍රියාත්මක වන බව දක්නට ලැබෙයි.

### ආශ්‍රිත ග්‍රන්ථ

පතිරගේ, .ජේ.එම්.පී. (2011), *''සංවර්ධන ආර්ථික විද්‍යාව න්‍යායන් සහ සංකල්ප''*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

බීම්ස්, එන්. (1994), *''නිෂ්පාදනයේ භූගෝලීයකරණය සහ ජාත්‍යන්තර කම්කරු පන්තියේ කර්තව්‍යයෝ''*, කම්කරු මාවත ප්‍රකාශකයෝ, කොළඹ 10.

ප්‍රනාන්දු, කේ.ඒ.එස්. (2005), *''නව නිදහස්වාදයේ ගෝලීයකරණය''*, ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

මන්ඩෙල්, ඒ. (1980), *''මාක්ස්වාදී ආර්ථික විග්‍රහය''*, මාර්ග ප්‍රකාශන හා පරිවර්තන, මාර්ග ආයතනය, කොළඹ.

ෆොන්සේකා, කේ. (2005), *''විද්‍යාව හා සමාජවාදය''*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ ,කොළඹ 10..

අන්ද්‍රාදි, වි. (2011), *''කොල්ලකාරී ධනවාදයට එරෙහිව මාක්ස්වාදය''*, කර්තෘ ප්‍රකාශනයකි, නුගේගොඩ.

Galbraith, J.K. (1965), *"Economic Development"*, Harvard U.P, Cambridge.

Kindleberger, C.P. (1977), *"Economic Development 3rd edition"*, Mcgrow-Hill Book Company, Tokyo.

Duraisingam, T. (1993), *"Compendium on Marxism Leninism"*, Council for Socialist Studies, Colombo 12.

Study (2012), "*Economic Determinism and Karl Marx: Definition & History*", http://study.com/economic -determinism-and-karl-marx-definition-history, viewed on 12 Auguest 2015.

Stor, J. (2010), *"MARX'S "ECONOMIC DETERMINISM" IN THE LIGHT",* www. jstor.org/stable/2763254, viewed on 12 Auguest 2015.